ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
---------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 13 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ඉරක්කාමම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංශ 2 අනුව ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වුවද, එවැනි මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු විගණන ගාස්තු රු. 8,500 සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් රු. මිලියන් 10 ක වියදමින් ඉදිකර සභාව වෙත භාරදෙන ලද ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්වලට ගෙන තිබුණි.

#### 1.3.3 විගණන සඳහා සාක්ෂි නොවීම

පහත එක්එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයන් | වටිනාකම් | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ලිබඩු සහ සවි කිරීම් | 809,902 | ස්ථාවර වත්කම් ලේඛනය |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,147,518 | ස්ථාවර වත්කම් ලේඛනය |
| මස් කඩ හිඟ බදු කුලිය | 1,032,909 | මස් කඩ බදු ලේඛනය |

1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති සහ රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ශනය විය.

| නීති, රීති යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති 217 | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | අංක පීඑෆ්/437දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛනය | වාහන සඳහා රක්ෂණ ආවරණ ජාතික රක්ෂණ භාර අරමුදලෙන් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් පමණක් ලබාගතයුතු වුවද, එයට පටහැනිව වාහන හතරක රක්ෂණ ආවරණ පුද්ගලික රක්ෂණ ආයතයෙන් රු. 16,487 ක් ගෙවා ලබාගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 778,948 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 58,373 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. 720,575 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 වරිපනම් බදු

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් හා ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වලින් වරිපනම් බදු අතුරු ව්‍යවස්ථා පනවා අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්

2003 සිට 2013 වර්ෂය අවසානය දක්වා හිඟව තිබූ මස්කඩ බදුකුලි රු. 1,032,959 ක් අයකර ගැනීමට හෝ අදාල අයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

2.2.3 බලපත්‍ර ගාස්තු අයකිරීම්

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය අනුව බලප්‍රදශයේ පුද්ගලික ආයතන, තමන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිත කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 9 ක් සඳහා බලපත්‍ර ගාස්තු සභාව විසින් අයකර නොතිබුණි.

2.2.4 උසාවි දඩ සහ මුද්දර ගාස්තු
-------------------------------

(අ) උසාවි දඩ
-----------

සමාලෝචිත වර්ෂය සඳහා ලැබියයුතු උසාවි දඩ රු. 25,000 ක් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර තොතිබුණි.

(ආ) මුද්දර ගාස්තු
--------------

2004 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු රු. 206,881 ක් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) ආදායම් පරිපාලනය